www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මැසචුසෙට්ස් මැතිවරනයේ පාඩම්

**The lessons of the Massachusetts election**

**2010 ජනවාරි 22**

එඩ්වඩ් කෙනඩිගේ මරනයෙන් අනතුරුව හිස් වූ සෙනෙට් ආසනය සඳහා අඟරුවාදා පැවති මැසචුසෙට්ස් මැතිවරනයේදී රිපබ්ලිකන්වරුන්ගේ ජයග්‍රහනය ඔබාමා පාලන තන්ත්‍රයට සහ ඩිමොක්‍රටික් පක්ෂයට එල්ල වූ තදබල ප්‍රහාරයක් පමනක් නොව, එක්සත් ජනපදය තුල ගොඩනැගෙමින් පවතින පලල් සමාජ කලකිරීම සහ කෝපය පිලිබඳ ප්‍රකාශනයක් ද වේ.

නියත වශයෙන්ම සිදුව ඇත්තේ, මහ ව්‍යාපාරිකයන්ගේ පක්ෂ ද්වය [ඩිමොක්‍රටික් පක්ෂය හා රිපබ්ලිකන් පක්ෂය] විසින් අධිකාරය දරන දේශපාලන පද්ධතියක සීමාව ඇතුලත, ඔබාමාගේ දක්ෂිනාංශික ක්‍රියාපිලිවෙත්වලට එරෙහි මහජන විරෝධයේ වාසි රිපබ්ලිකන් පක්ෂය සහ ආන්තික දක්ෂිනාංශික බලවේගයන්ට බද්ධ වූ මැතිවරන අපේක්ෂකයෙක් විසින් ගසාකනු ලැබ තිබීමයි.

ඔබාමා පාලන තන්ත්‍රයේ ක්‍රියාමාර්ගයන්, ජයග්‍රහකයා වූ රිපබ්ලිකන් රාජ්‍ය සෙනෙට් සභික ස්කොට් බ්‍රවුන්හට, වැඩෙන විරැකියාව සහ - මිලියන ගනනක් වන කම්කරුවන්ගේ සහ මධ්‍යම පන්තික ජනයා සඳහා වන සේවාවන් සහ වරප්‍රසාදයන් කැපීම මගින් ආන්ඩුව සහ සංගත වෙනුවෙන් සෞඛ්‍ය ආරක්ෂන වියදම් කපා හැරීම එල්ල කරගත් වැඩසටහනක් වූ - ඔබාමාගේ ප්‍රතිගාමී සෞඛ්‍ය ආරක්ෂන "ප්‍රතිසංස්කරනය" කෙරෙහි වැඩෙන ජනතා වෛරයට වාචාල ලෙස ආයාචනා කිරීමට ඉඩ ප්‍රස්ථාව සලසා දුනි.

කලකිරීම පිලිබඳ ප්‍රකාශනය තුලින් හා එනයින්ම ජීවන කොන්දේසීන්ට හා ප්‍රජාතාන්ත්‍රික අයිතීන් වෙත එල්ල කෙරෙන ප්‍රහාරයන්ට පිලිතුරක් නොවේ. මැසචුසෙට්ස් මැතිවරනයේ පාඩම් උකහා ගැනීම අත්‍යවශ්‍ය වන්නේ එහෙයිනි.

පෙරදැකිය හැකි වූ පරිදි ම ඩිමොක්‍රටිකයන්ගේ ප්‍රතිචාරය වූයේ තවදුරටත් දකුනට බඩගා යාමයි. බදාදා දින ඒබීසී පුවත් සමඟ පැවති සම්මුඛ සාකච්ඡාවක දී ජනාධිපති ඔබාමා, රක්ෂනාවරනය නොමැති අයගේ සුවසේවා ආවරනය අහෝසි කිරීමටත් වියදම් කපා හැරීමටත් තමා සූදානම් බව කියා පෑවේය. ජනතාවට පෞද්ගලික වෙලඳපොලෙන් රක්ෂනය මිල දී ගැනීමට, මුල් සැලස්මේ නෛතික නියාමය අත්හැර දමමින් රක්ෂන සමාගම් එයට ප්‍රතිචාර දැක්වූ අතර ප්‍රතිඵලය වනු ඇත්තේ වාරිකයේ තවදුර ඉහලයාමකි.

සංගත දූෂකයන්ට නාස්ලනුව දැමීමට පනවා ඇති ඕනෑම පියවරක් මෙන් ම බැංකු මත පනවා ඇති සංකේතාත්මක රෙගුලාසි පවා අත්හැර දැමීමට තමන් සූදානම් වෙමින් සිටින බව ප්‍රමුඛ පෙලේ ඩිමොක්‍රටිකයන් විසින් ඉඟි කර සිටියහ. ඔබාමාගේ උපදේශකයන්, රැකියා සහ ආර්ථිකය කෙරෙහි "කේන්ද්‍රීය" අවධානයක් යොමු කිරීම පිලිබඳ කෙරෙන කතාබහ වනාහී සුවසේවා සහ සමාජ ආරක්ෂනයන් වැනි පිලිගත් මූලික සේවා අයිතීන්වලට පෙර නුවූ විරූ ප්‍රහාරයක් එල්ල කිරීමත් මහා ව්‍යාපාරිකයන් සහ ධනවතුන්ට වඩාත් බදු සහන පිරිනැමීම සඳහාත් ඇති සූදානම පිලිබඳ ඉඟියකි.

මැතිවරනය පැවැති අඟහරුවාදා දින ඔබාමා සහ කොන්ග්‍රසයේ ඩිමොක්‍රටිකයන් මෙඩිකෙයාර් සහ අනෙකුත් සමාජීය සුභසාධක සේවාවන් දැවැන්තව කප්පාදු කිරීමේ යෝජනා සැකසීමට ද්වි පාර්ශවීය කොමිෂමක් පිහිටුවීමට එකඟ වූහ. මූල්‍යමය දෘඪභාවය සහ සංගතවල බදු කපා හැරීම රැකියා නිර්මානය කිරීමට පවතින ප්‍රධාන යතුරු යැයි ඊලඟ සතියේ පැවැත්වීමට නියමිත රාජ්‍ය තත්ව දේශනයේදී ඉදිරිපත් කිරීමට ඔබාමා අපේක්ෂා කරයි.

නිසැකයෙන්ම, මෙම ප්‍රතිගාමී වැඩපිලිවෙල ජනප්‍රිය වාචාලත්වයේ මාත්‍රවක් ද සමඟ ගලතා ඉදිරිපත් කිරීමෙන් තමන්ට යලි වතාවක් ඇමෙරිකන් මහජනයා මුලා කල හැකියයි ඔබාමාගේ පන්දම්කාරයෝ විස්වාස කරති. ඔවුහු වරද්දාගෙන ඇත්තාහ. ඩිමොක්‍රටික් ඡන්ද දායකයින්ගේ ඡන්දය ප්‍රකාශ කිරීම බිඳවැටීමක් අත්දුටු මැසචුසෙට්ස් මැතිවරනය පෙන්නුම් කරනු ලැබුවේ, "වෙනසේ" ඡන්ද අපේක්ෂකයා වෙනුවෙන් ඡන්දය දුන් මිලියන ගනනක් ජනයා ඔහුගේ මෙහෙයුම අමු ප්‍රෝඩාවක් ලෙස දැකීමට පටන් ගෙන තිබීමේ කාරනාවයි.

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* විශ්ලේෂනය මුලුමනින්ම සනාථ වී තිබේ. ඔබාමා තේරී පත්වීමෙන් සතියකට පසු *ලෝසවෙඅය* මෙලෙස සටහන් කලේය: "ඔබාමාගේ ජයග්‍රහනයේ ආරම්භක ප්‍රමෝදය කවරක් වුවද, එතරම් කල් නොයාම ගැඹුරු වෙමින් පවත්නා ආර්ථික අර්බුදය කෝටි සංඛ්‍යාත ඇමෙරිකානු මහජනයාගේ ජීවිත මතට කාන්දුවෙනු ඇති අතර නව පාලන තන්ත්‍රය දෙපා රඳවා සිටින පන්ති අවශ්‍යතාවන් කලඑලි බැසීමට පටන් ගනු ඇත. මෙය එක්සත් ජනපදය තුල පන්ති අරගලයේ නව කාල පරිච්ඡේදයකට වේදිකාව සකසනු ඇත."

මැසචුසෙට්ස් අන්ත පරාජය ඩිමොක්‍රටික් පක්ෂයට පමනක් නො ව ඔබාමාටමත් බියකරු පරිකතනයකි. ඔහු - මොනයම්ම හෝ සමාජ ප්‍රතිසංස්කරනයක් නොඉවසන සහ කම්කරු පන්තිය කෙරෙන් වැඩෙන පරිමානයෙන් පරත්වාරෝපනය වීමත් කම්කරු පන්තියට සතුරුව පිහිටා සිටීමත් සමග සමපාත වූ - අනන්‍යතා දේශපාලනය අදහන දශක ගනනාවක් වන ඇමෙරිකන් ලිබරල්වාදයේ පරමාදර්ශයයි. අනන්‍යතාවේ සහ ඉහල මධ්‍යම පන්තියේ වරප්‍රසාදිත තට්ටුවලට ආයාචානා කිරීමේ ක්‍රමෝපායන් මගින් ඩිමොක්‍රටික් පක්ෂය වඩාත් සමීපස්තව ඇමෙරිකානු මූල්‍යමය කතිපයාධිකාරය සමග ගැටගැසී පවතී.

මැතිවරනයෙන් අනතුරුව ඔබාමා මේ සා වේගයෙන් රිපබ්ලිකානුවන් සමග සහනශීලිතාවකට මාරුවී යාමේ කරුන විදහා දක්වන්නේ, පක්ෂ ද්වය අතර උග්‍ර මාරාත්මක දේශපාලන යුදකෙලි පැවතියේ වුවත්, පාලක පන්තියේ මූලික අවශ්‍යතාවලට බලපාන සියලුම අතිමූලික කාරනාවන්හි දී ඔවුන්ගේ වෙනස්කම් පසෙකට අතුගා දැමිය හැකි බවයි.

උකහාගත යුතු දේශපාලන පාඩම් මොනවාද?

මූල්‍යමය ප්‍රභූව විසින් පාලනය කරන්නාවූ ද්වි පක්ෂ රාමුව ඇතුලත වැඩකරන ජනයාගේ අවශ්‍යතාවන් සහ අභිලාශයන්ට ප්‍රකාශනයක් සොයාගත නොහැකි ය. කම්කරු පන්තිය ඩිමොක්‍රටික් පක්ෂයත් ද්වි පක්ෂ ක්‍රමයත් ප්‍රතික්ෂේප කල යුතු අතර පාලක පන්තියට එරෙහිව තමන්ගේ අවශ්‍යතාවන් ප්‍රකාශයට පත් කරන ස්වාධීන මහජන ව්‍යාපාරයක් ගොඩ නැගිය යුතුය.

විරැකියාව, මර්දනය සහ යුද්ධයට එකම විකල්පය වන්නේ, මූල්‍යම ප්‍රභූ තන්ත්‍රයේ යදම් සුනු විසුනු කර දැමීමට සහ ප්‍රජාතන්ත්‍රික හා සමානාත්මතාවේ අඩිතාලම මත සමාජය ප්‍රතිසංවිධානය කිරීමට විප්ලවවාදී සමාජවාදී වැඩපිලිවෙලක් සඳහා සටන් කිරීමයි.

සමාජවාදී සමානතා පක්ෂයේ වැඩලිවෙල වන්නේ මෙයයි.

ජෙරී වයිට්

© www.wsws.org